**සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2021**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය ` පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්ෂය කර අවසන් වී තිබුණු නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.787,540ක් වූ සන්නිවේදන උපකරණ, රු.10,096,197ක් වූ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ රු.23,063,419ක් වූ පරිගණක උපාංග , රු.9,932,023ක් වූ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ යන ජංගම නොවන වත්කම් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 විධිවිධාන පරිදි මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට සහ එම වත්කම්වල ඵලදායී ජීවන කාලය සඳහා වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. 2021 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණයක් සිදුකර නොමැති අතර ඒ සඳහා හෙළිදරව් කිරීමක් සිදුකර නොමැත. 2021 වර්ෂයේ රට තුළ ඇතිව තිබූ කොවිඩ් වසංගත තත්වය තුළ ඇති වූ සීමාවන් නිසා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට නොහැකි වූ අතර, 2022 වර්ෂයේ අදාළ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු සිදු කරනු ඇත. | ක්ෂය කර අවසන් වී තිබුණු ජංගම නොවන වත්කම් ගිණුම්කරණ ප්‍රමිති පරිදි මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කිරීමට හා ඵලදායී ජීවන කාලය සඳහා වූ ඇස්තමේන්තු ගත දෝෂය ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා නව පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රු.1,090,250ක් වැයකර තිබුණු නමුත් මෘදුකාංග පද්ධතිය ස්ථාපන කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවත් මෙකී පරිගණක පද්ධතිය සඳහා දරා තිබුණු පිරිවැය කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 07ට පටහැනිව ජංගම නොවන වත්කම් යටතේ පරිගණක මෘදුකාංග ලෙස ගිණුම්ගත කර 2019 වර්ෂයේ සිට වාර්ෂිකව සියයට 25 බැගින් ක්ෂය කර තිබුණි. මෙම නිසා මණ්ඩලයේ ජංගම නොවන වත්කම් ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් ද , සමුච්චිත ඌනතාවය රු.783,337ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වන අතර 2019 වර්ෂයේදී මෙම ගෙවීම ජංගම නොවන වත්කම් ලෙස ගිණුම් ගතකර ඇති අතර වර්ෂයට 25% බැගින් ක්ෂය කිරීම සිදුකර ඇත. | ප්‍රමිතියට අනුකූලව කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම යටතේ සාමාජිකත්වය ලබා තිබුණු සාමාජිකයන් අතුරින් අක්‍රීය වූ සාමාජිකයින් සක්‍රීය කිරීමේ වැඩසටහනට සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.මිලියන 2.2ක රජයේ ප්‍රතිපාදන වලින් අක්‍රීය සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා රු.1,422,576 ක් වැය කර තිබුණි. මෙහෙයුම් වියදම අයහාර වියදම් ලෙස ආදායමට ලියාහැරීම වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ දේපල, පිරියත හා උපකරණ වශයෙන් ගිණුම්ගත කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයට වූ වත්කම් හා මෙහෙයුම් අතිරික්තය එකී ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මෙම මුදල වන රු. මිලියන 1.422 වෙනත් ප්‍රාග්ධන වියදම් ලෙස පෙන්වා දී ඇත. මෙම වියදම්වල අපේක්ෂිත ප්‍රතිලාභ වසර 10කින් ලැබේ යැයි ඇස්තමේන්තුගත කර ඇති බැවින් එක් වසරකට අදාළ වියදම පමණක් වියදමක් ලෙස කපා හැර ඇත. | මෙහෙයුම් වියදම ප්‍රාග්ධනිත නොකර අයහාර වියදමට ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල සමාජිකත්වය ලබාගත් සමාජිකයන් විසින් 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල බැංකු ගිණුම්වල තැන්පත් කර තිබුණු රු.5,757,980ක් වූ වාරික මුදල් සමාජිකයන්ගේ අනන්‍යතාවය හඳුනාගෙන සමාජිකයන්ගේ කේවල ගිණුම් වලට ගිණුම්ගත කරනු වෙනුවට වෙනත් වගකීම් යටතේ හඳුනානොගත් තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ වෙනත් වගකීම් ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මෙය දීර්ඝ කාලීනව පවතින ගැටලුවක් වන අතර දායකයින් මුදල් බැංකු වෙත ගෙවීමේදී අවශ්‍ය තොරතුරු ලබා නොදීම හේතුවෙන් දායකයින් නිශ්චිතව හඳුනාගත නොහැකි අවස්ථාවලදී තාවකාලිකව හඳුනානොගත් තැන්පතු ලෙස ගිණුම්ගත කරනු ලබයි.2022 වර්ෂයේදී මෙම අගය රු.මි.3 දක්වා අඩු කිරීමට පියවර ගෙන ඇති අතර මෙම අගය කඩිනමින් හඳුනාගැනීමට කටයුතු කරනු ඇත | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල සමාජිකත්වය ලබාගත් සමාජිකයන් විසින් ගෙවන ලද දායක මුදල අදාල සමාජිකයන්ගේ කේවල ගිණුම් වලට ගිණුම්ගත කර හඳුනානොගත් තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ 15(2) වගන්තිය | ප්‍රතිලාභ අහිමි වී ඇති විට ඒ බව මණ්ඩලය විසින් එම දායකයාට දැන්විය යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට රු.672,733ක් වූ අක්‍රීය තත්ත්වයේ පැවති දායකයන්ට ප්‍රතිලාභ අහිමි වී ඇතිබව දැනුම් දී නොතිබුණි. කෙසේ වෙතත් 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල අක්‍රීයවී ඇති දායකයන් හඳුනාගැනීමට ද නොහැකිවී තිබුණි. | සාමාජිකයන්ගේ තොරතුරු රැස්කරනු ලබන පරිගණක මෘදුකාංගය නිසිපරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අක්‍රිය සාමාජිකයින් සම්බන්ධ නිවැරදි තොරතුරු ලබාගැනීමට නොහැකිවී ඇත. නව පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපනය කිරීමට කටයුතු කරමින් පවතී. ඉන්පසු සියළු අක්‍රිය සාමාජිකයන් වෙත නිවේදන නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. සුරැකුම, ආරස්සාව සහ ඉසුරු යෝජනා ක්‍රමවල අක්‍රිය දායකයින් සංඛ්‍යාව 345,832 වේ. අක්‍රිය දායකයින් 40,628ක් වෙත ලිපි යැවීමට කටයුතු කර ඇත. 2022 වර්ෂයේ නව ව්‍යාපෘතිය යටතේ සියලුම අක්‍රිය දායකයින් සඳහා ලිපි යැවීමට කටයුතු කරනු ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව අක්‍රීය වී ප්‍රතිලාභ අහිමි වූ සාමාජිකයන් දැනුවත් කර විශ්‍රාම ප්‍රතිලාභ අහිමි වීම වැලැක්වීමට කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 15,106,709 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,041,238 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,065,471 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ ප්‍රදාන ආදායම රු.3,507,444 ක් හා වැටුප්, සැපයුම් හා සේවා, ගිවිසුම්ගත සේවා හා නඩත්තු යනාදී වියදම් රු.5,984,725 ක් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා මණ්ඩලයේ අරමුදලින් රු.මිලියන 195 ක් ගෙවා අංක 18, රාජගිරිය පාර, රාජගිරිය පිහිටි ගොඩනැගිල්ල 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව රු.මිලියන 165 ක් වූ රජයේ තක්සේරු වටිනාකම ඉක්මවා වැඩි මිලකට දේපල මිලදී ගැනීම හේතුවෙන් මණ්ඩලයට රු.මිලියන 30 ක පාඩුවක් සිදුකර තිබුණි. එය මූල්‍ය අනුක්‍රමිකතාවයක් නොවන බවට විගණනයේදී බැහැර කල නොහැකි වූ අතර වර්ෂ 09 ක කාලයක් ඉකුත් වී තිබුණ ද , ඊට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නෛතික කටයුතු ඉටුකර පාඩුව පූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ අනුව අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු යටතේ විමර්ශනයක් සිදු වෙමින් පවතින අතර, එම විමර්ශන නිර්දේශයන් අනුව වැඩිපුර මුදල් ගෙවීමට වගකිව යුතු පුද්ගලයින් හඳුනාගැනීම සහ ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | මණ්ඩලයට සිදුවී තිබුණු පාඩුව පිළිබඳව ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන එකී පාඩුව පූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම යටතේ සාමාජිකත්වය ලබා තිබුණු සාමාජිකයින් 882,665 දෙනෙකු අතුරින් අක්‍රිය වූ සාමාජිකයින් 672,733 දෙනෙකු සක්‍රීය කිරීමේ වැඩසටහනට සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු. මිලියන 2.2 ක රජයේ ප්‍රතිපාදන වලින් දැනුවත් කිරීමේ වැඩසටහන් , ප්‍රවර්ධන වැඩසටහන් හා තැපැල් ගාස්තු යනාදී මෙහෙයුම් වියදම් වශයෙන් රු.1,422,576 ක් දරා තිබුණ ද අක්‍රීය සාමාජිකයින්ගෙන් සක්‍රීය කිරීමට හැකිව තිබුණේ 03 දෙනෙකු පමණකි. මේ හේතුවෙන් වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කිරීම නතර වී තිබුණු අතර රු.777,424 ක් වූ ඉතිරි ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | අක්‍රීය දායකයින් සක්‍රීය කිරීමේ ව්‍යාපෘතිය 2022 වර්ෂය දක්වා සමාජ ආරක්ෂණ අංශයෙන් සිදුකෙරුන අතර 2022/09/01 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රැස්කිරීම් අංශයට භාර දී ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නතර කිරීමක් සිදු වී නොමැති අතර නව ව්‍යාපෘති සැලසුමක් සහ නව චක්‍රලේඛයක් අනුව ඉතා සක්‍රීය ලෙස මෙම ව්‍යාපෘතිය සිදු කරනු ලබයි. | ඉතිරි ප්‍රතිපාදන ද උපයෝජනය කර අක්‍රීයවූ දායකයන් සක්‍රීය කිරීම වෙනුවෙන් කඩිනම් හා කාර්යක්ෂම ලෙස පියවර ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සහන, තිලින, ඉසුරු, සරන, ධන ලක්ෂ්මි, සුරැකුම සහ ආරස්සාව යනාදී වශයෙන් විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ යෝජනා ක්‍රම 07ක් 1996 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුල ආරම්භකර තිබුණ ද යෝජනා ක්‍රම 05ක් සඳහා සාමාජිකයන් බඳවා ගැනීම 2012 වර්ෂයේ සැප්තැම්බර් සිට අත්හිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක වූයේ සුරැකුම හා ආරස්සාව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම 02ක පමණක් වන අතර එම යෝජනා ක්‍රම 02 සඳහා සාමාජිකයන් 446,444ක් බඳවාගෙන තිබුණ ද , එයින් සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ සක්‍රිය සාමාජිකයින් සංඛ්‍යාව 100,617 ක් හෙවත් සියයට 22 ක් පමණක් විය. ඔප්පුව යටතේ ප්‍රතිලාභ අහිමි වුවත් සහ වාරික ගෙවීම් මඟහැරී පවතින දායකයින් පිළිබඳව තොරතුරු කාලීනව ලබා නොගැනීම මත එම පුද්ගලයන්ට ඒ පිළිබඳව දැනුම් දීමක් සිදුකර නොතිබුණු හෙයින් අක්‍රීයත්වයට පත්වන දායක සංඛ්‍යාවේ ඉහළ තත්ත්වයක් නිරීක්ෂණය විය. වාරික ගෙවීම් අතපසුවීම් පිළිබඳව දායකයන් දැනුවත්කර තිබුණේනම් අතපසු වීම මෙන්ම අක්‍රීය තත්ත්වයට පත්වීම වැළැක්වීමට අවකාශ සලසා ගත හැකිව තිබුණි. නමුත් එම ක්‍රියාමාර්ග ගෙන නොතිබීම අක්‍රීය දායකයින් ඉහළ යාමට ප්‍රධාන හේතුව වී තිබුණි. | මෙම සාමාජිකයන් 436,221 න් 375,213 දෙනෙකු රජයේ දායකත්වයක් අපේක්ෂිතව ජීවගණක තක්සේරු වාර්තා සකස්කර හඳුන්වාදී ඇති සහන සහ තිළිණ යෝජනා ක්‍රමවල සාමාජිකයන්ය. එම යෝජනා ක්‍රමයන්ට අවශ්‍ය රජයේ මූල්‍ය දායකත්වය ප්‍රතිපූරණය නොවීම හේතුවෙන් 2012 වර්ෂයේදී නිකුත්කළ 1/2012 චක්‍රලේඛය මගින් එකී යෝජනා ක්‍රමවලට සාමාජිකයන් බඳවාගැනීම සහ සක්‍රිය කිරීම අත්හිටුවන ලදී එසේම සුරකුම හා ආරස්සාව ව්‍යාපෘති ආරම්භයේ සිට 2021 වර්ෂය දක්වා අක්‍රිය සාමාජිකයින් හඳුනාගෙන ඇති අතර, එම දායකයින් සක්‍රිය කිරීම සඳහා නව ව්‍යාපෘති ආරම්භ කර ඇත.මේ වන විට එම සාමාජිකයින් දැනුවත් කිරීම, අක්‍රිය නිවේදන තැපැල් කිරීම සහ සක්‍රිය කිරීම් කටයුතු ආරම්භ කර ඇත.<br>මෙම තත්ත්වයට හේතුවී ඇත්තේ පවතින පරිගණක දත්ත පද්ධතිය තුළින් අවශ්‍ය තොරතුරු ලබාගැනිමට නොහැකිවීම වේ. එබැවින් නව පරිගණක පද්ධතිය හඳුන්වා දීමට කටයුතු ආරම්භ කර ඇති අතර, ඒ අනුව දායකයින්ගේ අක්‍රියවීම් පිළිබඳව දැනුවත් කිරීමට හැකිවනු ඇත. | ක්‍රියාත්මක සුරකුම හා ආරස්සාව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා සාමාජිකයන් බඳවා ගැනීම කාර්යක්ෂම කිරීමට හා වාරික ගෙවීම් මගහැරී ප්‍රතිලාභ අහිමිව තිබුණු සාමාජිකයන් හට ප්‍රතිලාභ අහිමිවූ බව දැනුම් දීමට කටයුතු කර සාමාජිකයන් අක්‍රිය වීම වැලැක්වීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සාමාජිකත්වය අක්‍රිය වීම හෝ සාමාජිකත්වය අවලංගුකර ගැනීම මත සියයට 25ක් හෝ ඊට වැඩියෙන් වාරික මුදල් ගෙවූ සාමාජිකයන් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල ගෙවූ වාරික මුදල් | රජයේ දායකත්වය නොලැබීම නිසා සහන, තිළිණ යෝජනාක්‍රමවල අක්‍රිය සාමාජිකයන් සක්‍රීය නොකර සාමාජිකයන්ගේ ඉල්ලීම මත, ශුද්ධ දායක මුදල් ගෙවීමට හා අක්‍රිය සාමාජිකයන් හට වෙනත් යෝජනා | සාමාජිකයන් විසින් ගෙවූ වාරික මුදල් ආපසු ලබා ගෙන යෝජනා ක්‍රම වලින් ඉවත්ව යාම වලක්වාලීමට |

| | | | |
|---|---|---|---|
| | වලින් රු.මිලියන 180.7ක් ආපසු ලබාගැනීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. එම දායකයින් ඉවත්වයාම වෙනුවට දායකත්වය තවදුරටත් පවත්වා ගැනීම වෙනුවෙන් වූ විධිවිධානයන් හා පිළිවෙත් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | ක්‍රම වලට දායකවීමට හා පවුලේ සාමාජිකයන් යෝජනා ක්‍රමයකට සාමාජික කර ගිණුම් ශේෂය මාරුකිරීමටත්, ඊට එකඟ නොවන සාමාජිකයන්ට මුදල් ආපසු ගෙවීමටත් කටයුතු කර ඇත. යෝජනා ක්‍රමයට බැඳීමට තිබූ සුදුසුකම් රජයේ රැකියාවක් ලැබීම නිසා අහිමිවීම හේතුවෙන් ශුද්ධ දායක මුදල් ආපසු ගෙවීම් සිදුකර ඇත. | සැලසුම් ගත කාර්යක්ෂම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වය මත 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු කලාකරුවන් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙනුවෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය රු.මිලියන 94 ක මුදලක් ලබාදී තිබුණි. එම මුදල බැංකු ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදල් ශේෂය රු.මිලියන 104.97 ක් දක්වා වර්ධනය කරගෙන තිබුණි. නමුත් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා 2017-2021 කාලය තුල කලාකරුවන් 234 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. එයින්ද කලාකරුවන් 142 දෙනෙකුගේ සාමාජිකත්වය අක්‍රීය වී තිබුණු හෙයින් යෝජනා ක්‍රමය යටතේ සක්‍රීය සාමාජිකයන් සංඛ්‍යාව 92 ක් වූ ඉතා අඩු තත්ත්වයක් විය. | එලඹී තිබුණු අවබෝධතා ගිවිසුම අනුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් කලාකරුවන් තෝරාගෙන එම කලාකරුවන්ගේ නියමිත වාරික මුදල් ද සමඟ මණ්ඩලයට යොමුකරන ලදී. කලාකරුවන් සක්‍රියව පවත්වා ගැනීම හා ගෙවිය යුතු වාරික මුදල කලාකරුවන්ගෙන් අයකර ගැනිම සංස්කෘතික නිලධාරීන්ගෙන් සිදු නොවිය. කලාකරුවන් වෙනුවෙන් රු. 50,000 ක ස්ථාවර තැන්පතුවක් පවත්වාගැනීම සඳහා රුපියල් මිලියන 94 ක තැන්පතුවක් දෙපාර්තමේන්තුව ලබාදී ඇත. මෙම සේවාවන් දෙපාර්තමේන්තුවෙන් ප්‍රමාණවත් පරිදි සිදුනොවීම හේතුවෙන් මණ්ඩලය විසින් කටයුතු කර කලාකරුවන් 372 දෙනෙකු වෙත සාමාජිකත්වය ලබා දී ඇත. කලාකරුවන් සක්‍රීය කිරීමේ කටයුතු කරමින් පවතියි. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා කලාකරුවන් බඳවා ගැනීමේ කටයුතු විධිමත් කර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ සමස්ථ කලාකරුවන් වෙත ලබා දීමට කටයුතු ක්‍රියාත්මක කල යුතුය. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීමට සැලසුම් කර ඒ සඳහා රු.12,511,000 ක් වූ ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 ක කාලයක් ගතවී ඇතත් මෙම පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මණ්ඩලයේ සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල මෙහෙයුම් කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි. | සැපයුම් ආයතනය සමග 2018 ගිවිසුම්කට එලඹුණි.පරිගණක පද්ධතියේ විස්තරාත්මක මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර වාර්තාවේ (DSRS) සියලු කොටස් ආවරණය වී නොතිබීම නිසා 2021 දී සංශෝධිත පිරිවිතර වාර්තාව (DSRS) පදනම්ව රු. මිලියන 1.1ක අතිරේක වියදම් ඇස්තමේන්තුවක් යටතේ සම්පූර්ණ කර දීමට සැපයුම් ආයතනය එකඟ වී ඇත. පද්ධතියේ ඉදිරි කටයුතු වසරක් තුළ අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා නව මෘදුකාංග පද්ධතිය ස්ථානපනය කර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල මෙහෙයුම් කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යාමට කඩිනම් පියවර ගත යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුල ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා රු.5,000,000ක් හා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා රු.3,800,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් පිළිවෙලින් සියයට 100 ක හා සියයට 48 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් රු.5,000,000 ප්‍රතිපාදන වෙන්කර තිබුනද ලැබී තිබුණේ රු.4,000,000 පමණකි. ඒ සඳහා මිල ගණන් කැඳවා තිබුණද ඉදිරිපත් වූ මිල ගණන් ඉතා ඉහළ වූ බැවින් කොටස් 02ක් යටතේ නැවත මිල ගණන් කැඳවීමට සිදුවිය. කටයුතු සිදු කරමින් පවතී. ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාත්මක කර ඇණවුම් යවා තිබුණද සීඝ්‍ර මිල ඉහළ යාම හේතුවෙන් එම භාණ්ඩ සැපයීම සැපයුම්කරුවන් විසින් ප්‍රතික්ෂේප කෙරිණි. නැවත මිලගණන් කැඳවා පවතින ප්‍රතිපාදන සීමාවන් තුළ මිලදී ගැනීමට නියමිතය. | ප්‍රසම්පාදන සැලැස්ම අනුව ප්‍රසම්පාදන කටයුතු කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කර ප්‍රසම්පාදනයන් නිසි කලට සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |